**ශ්‍රීලන්කන් කේටරින් සමාගම - 2022/ 2023**

**------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රීලන්කන් කේටරින් සමාගමේ ("සමාගම") 2023 මාර්තු 31දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරි සමාගමක සහය මා ලබා ගන්නා ලදි.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2003 ජුනි 06 දිනැති PED 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2 වගන්තිය සහ 2007 උපදේශක සහ සේවා නියුක්තිය මාර්ගෝපදේශය | 2020 නොවැම්බර් 29 දිනැති අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයට අනුව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව හා 2007 උපදේශක හා සේවා නියුක්තිය මාර්ගෝපදේශයේ පරිදි ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමකින් තොරව 2020 දෙසැම්බර් 01 දින සිට වසරක කාලයක් සඳහා ශ්‍රීලන්කන් ගුවන් සේවා සමාගමට සහ ශ්‍රීලන්කන් කේටරින් සමාගමට සේවා සැපයීමේ පදනම මත රු.300,000 ක මාසික වැටුපකට ප්‍රසම්පාදන උපදේශකයෙකු කොන්ත්‍රාත් පදනම මත පත් කර තිබුණි. තවද, 2021 දෙසැම්බර් 01 සිට 2023 අගෝස්තු දක්වා කාලය තුළ වසරක කොන්ත්‍රාත් කාලය අඛණ්ඩව දීර්ඝ කර රු.මිලියන 2.8 ක උපදේශන ගාස්තු ගෙවා තිබුණි. කෙසේ වෙතත්, පැමිණීමේ වාර්තා සහ කළ වැඩ වාර්තා වැනි සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් කර නොමැත. | ශ්‍රී ලන්කන් ගුවන් සමාගම විසින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව ප්‍රසම්පාදන උපදේශකයෙකු පත් කර ඇත. මේ සම්බන්ධයෙන් අවශ්‍ය සියලුම තොරතුරු ශ්‍රී ලන්කන් ගුවන් සමාගම විසින් දැනටමත් ලබා දී ඇත. | මෙම ක්‍රියා වැළැක්වීමට හා වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.6 තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන ක්‍රම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රීලන්කන් ගුවන් සේවයේ - Corporate Information Security Privacy Management" අත්පොතෙහි 4.6.2.5 වගන්තියට අනුව, සමාගම විසින් සමාලෝචිත වර්ෂයේදී පරිශීලක ප්‍රවේශ හිමිකම් සම්බන්ධයෙන් කිසිදු සමාලෝචනයක් සිදු කර නොතිබුණි. පොදු පරිශීලක ප්‍රවේශ සමාලෝචන නොමැති වීමේ ප්‍රතිඵලයක් වශයෙන් සාමාන්‍ය පරිශීලකයින්ට ලබා දී ඇති නුසුදුසු ප්‍රවේශ | පද්ධතිය සඳහා පරිශීලක ප්‍රවේශ හිමිකම් සමාලෝචනය 2023 දෙසැම්බර් 18 දිනට අවසන් කරන ලද අතර, ඉදිරියේදී, අත්පොතට අනුව පද්ධති සඳහා පරිශීලක ප්‍රවේශ හිමිකම් පිළිබඳ සමාලෝචන ක්‍රමවත් කර අවම වශයෙන් වාර්ෂිකව සම්පූර්ණ කරනු ඇත. | ක්‍රියා පටිපාටිය නිසියාකාරව ක්‍රියාත්මක කර ලේඛනගත කර ඇති බව තහවුරු කර ගැනීම සඳහා, සියලුම තීරණාත්මක පද්ධතිවල පොදු පද්ධති පරිශීලක ගිණුම්වල පරිශීලක ප්‍රවේශ අයිතිවාසිකම් වරින් වර සමාලෝචනය කිරීම සහ ප්‍රමාණවත් ලියකියවිලි |

| | | | |
|---|---|---|---|
| | අයිතීන් පිළිබඳව කළමනාකරණය නොදැන සිටිය හැකි අතර සමහර පද්ධති සඳහා ලබා දී ඇති ප්‍රවේශ අයිතීන් සොයා ගැනීමට සහ සත්‍යාපනය කිරීමට කළමනාකාරීත්වය අසමත් වීමට හේතු විය හැක. | | පවත්වාගෙන යාම සමාගමට අත්‍යවශ්‍ය වේ. |
| (ආ) | ක්‍රියා පටිපාටිය නිසියාකාරව ක්‍රියාත්මක කර ලේඛනගත කර ඇති බව තහවුරු කර ගැනීම සඳහා, සියලුම තීරණාත්මක පද්ධතිවල පොදු පද්ධති පරිශීලක ගිණුම්වල පරිශීලක ප්‍රවේශ අයිතිවාසිකම් වරින් වර සමාලෝචනය කිරීම සහ ප්‍රමාණවත් ලියකියවිලි පවත්වාගෙන යාම සමාගමට අත්‍යවශ්‍ය වේ. Inflair Inflight පද්ධතියේ ජනනය කරන ලද පරිශීලක ලැයිස්තුවේ නිර්මාණය කළ දිනය, අවසන් පිවිසුම් දිනය, අක්‍රිය කළ දිනය, අක්‍රිය පරිශීලකයන් වැනි දත්ත ක්ෂේත්‍ර ග්‍රහණය කර නොමැත. අක්‍රිය කිරීමේ දිනය නොමැති වීම හේතුවෙන්, පරිශීලක ගිණුම් කාලානුරූපව අක්‍රිය කිරීම තහවුරු කිරීමට කළමනාකාරීත්වයට නොහැකි විය හැක. අවසාන පිවිසුම් දිනය නොමැතිව, විෂමතාවයක් ඇති විට, පරිශීලකයන් විසින් පද්ධතියට පිවිසුම් දිනය සත්‍යාපනය කිරීමට කළමනාකරණයට නොහැකි විය හැකිය. තවද, පරිශීලක තත්ත්වය නොමැතිව, පද්ධතියේ පරිශීලකයින්ගේ වත්මන් පරිශීලක ගිණුම් තත්ත්වය සත්‍යාපනය කිරීම අපහසුය. | අස්ථානගත වූ ක්ෂේත්‍ර සමඟ වාර්තා ආකෘතිය වැඩි දියුණු කිරීමේ හැකියාව සොයා බැලීමට 2023 අප්‍රේල් 25 දින වන විටත් වෙනස් කිරීමේ ඉල්ලීමක් සැපයුම්කරු වෙත ඉදිරිපත් කර ඇත. | පද්ධතිය ජනනය කරන ලද පරිශීලක ලැයිස්තු තුළ පරිශීලක නිර්මාණය කිරීමේ දිනය පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ. |
| (ඇ) | 2023 මාර්තු 31 දිනට සමහර පද්ධතිවල ඉල්ලා අස් වූ සේවකයින්ගේ පරිශීලක ගිණුම් නියමිත වේලාවට අක්‍රිය කර නොමැත. ඉල්ලා අස් වූ/ විශ්‍රාම ගිය/මාරු කරන ලද සේවකයන්ගේ පරිශීලක ගිණුම් කාලානුරූපව අක්‍රිය කිරීම පිළිබඳ ප්‍රමාණවත් ක්‍රියා පටිපාටි ව්‍යාපාර ගනුදෙනු සඳහා වගකීම් පැවරීමේදී සැලකිය යුතු ගැටලු ඇති කළ හැකිය. | හඳුනාගත් ගිණුම් අක්‍රිය කර ඇති අතර ඉවත්වීමේදී පරිශීලක ගිණුම් වහා අක්‍රිය කිරීමට පරිශීලක නිෂ්කාශන ක්‍රියාවලිය විධිමත් කරනු ඇත. | ගිණුම් අවභාවිත කිරීමේ අවදානම අවම කිරීමට උපකාරී වන බැවින් ඉල්ලා අස් වූ / විශ්‍රාම ගිය ස්ථාන / මාරු කරඇති සේවකයින් ආයතනයේ යෙදවුම් වෙත ප්‍රවේශය කඩිනමින් ඉවත් කිරීම වැදගත් වේ. |
| (ඈ) | Inflair පද්ධතියේ එක් පරිශීලක ගිණුමක් මුළුතැන්ගෙයි සේවය කරන සේවකයන් අතර පොදුවේ පවරා ඇත. යෙදුමක පරිශීලක ගිණුමක් බෙදා ගැනීම ව්‍යාපාරික ගනුදෙනු සඳහා වගකීම් වෙන් කිරීමේදී සැලකිය යුතු ගැටළු ඇති විය හැක. එම ගිණුම සේවකයින් කණ්ඩායමක් විසින් භාවිතා කර ඇති බැවින් ගනුදෙනු ජනිත කළ නිශ්චිත පුද්ගලයා | පොදු සහ බෙදාගත් ගිණුමක් වුවද, ඔවුන්ගේ ක්‍රියාකාරකම් අදාළ ස්ථාන මගින් සත්‍යාපනය කර සනාථ කරනු ලැබේ .තවද, පොදු ගිණුම එක් පරිශීලක දෙපාර්තමේන්තුවක් තුළ පවතින අතර ඔවුන්ගේ ක්‍රියාවන්හි වගවීම වැඩි කිරීම සඳහා වන්දි | ආරක්ෂක කඩවීම් විමර්ශනය කිරීමට පහසුකම් සැලසීම සඳහා සේවකයින් අතර බෙදාගෙන ඇති පරිශීලක ගිණුම තහනම් කිරීම ප්‍රමුඛ ක්‍රියාවයි. |

| | | |
|---|---|---|
| හඳුනා ගැනීමට සමාගමට නොහැකි විය හැකිය. තවද, පරිශීලකයින් කණ්ඩායමක් එකම පරිශීලක ගිණුමක් බෙදාගෙන ඇති බැවින් එවැනි ගනුදෙනු සඳහා තනි පුද්ගලයෙකුට වගකිව නොහැකිය. | පාලන මගින් භෞතික හැසිරීම සහ පැමිණීම නිරීක්ෂණය කරනු ලැබේ. එසේ වුවද, මෙහි හඳුනාගත් ගිණුම් ක්‍රියා විරහිත කර ඇති අතර අදාළ පරිශීලකයින් වෙත වෙනම පරිශීලක ගිණුම් ලබා දී ඇත. | |
| (ඉ) Oracle EBS පද්ධතිය තුළ යෙදුම්, දත්ත සමුදාය සහ මෙහෙයුම් පද්ධති මට්ටමේ විගණන logs සක්‍රීය කර නොමැති අතර Inflair Inflight පද්ධතිය තුළ දත්ත සමුදාය සහ මෙහෙයුම් පද්ධති මට්ටමේ විගණන logs සක්‍රීය කර නොමැත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පද්ධතියට නිශ්චිත යෙදුමක්, දත්ත ගබඩාවක් හෝ මෙහෙයුම් පද්ධති මට්ටමේ පරිශීලක ගිණුමක් මගින් සිදු කර ඇති ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට නොහැකි වේ. | විගණන logs සක්‍රීය කිරීමට ඇති හැකියාව සොයාබැලීමට 2023 අප්‍රේල් 25 දින සැපයුම්කරු වෙත වෙනස් කිරීමේ ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. Oracle: Oracle සඳහා විගණන logs එතැන් සිට සක්‍රීය කර ඇත. | යෙදවුම්, දත්ත සමුදාය සහ මෙහෙයුම් පද්ධති මට්ටම්වල විගණන logs, දත්ත සමුදාය හෝ මෙහෙයුම් පද්ධති ප්‍රවේශ කාල සීමාව තුළ පරිශීලක ගිණුම්වල සියලුම ක්‍රියාකාරකම් ග්‍රහණය කර ගැනීමට සැලසුම් කළ යුතුය. තවද, යෙදවුම්, දත්ත සමුදායන් හෝ මෙහෙයුම් පද්ධතිවල අනවසර පරිශීලක ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීමට පරීක්ෂණ පාලනයක් ලෙස නිත්‍ය අධීක්ෂණ ක්‍රියා පටිපාටි දිරිමත් කරනු ලැබේ. |
| (ඊ) සමාගම Inflair Inflight පද්ධතියේ මුරපද ආරක්ෂක පරාමිතිය ප්‍රමාණවත් ලෙස වින්‍යාස කර නොමැත. අනවසර පිවිසීමේ අවදානම අවම කිරීම සඳහා පරිශීලකයා එකම මුරපද වින්‍යාසයන් භාවිතා කිරීම වැළැක්වීම සඳහා මෙම පරාමිතිවල සංයෝජනය සැකසිය යුතුය. | මුරපද සැකසීම් වෙනස් කිරීම සඳහා වෙනස් කිරීමේ ඉල්ලීම 2023 අප්‍රේල් 25 දින සැපයුම්කරු වෙත යොමු කර ඇත. | අනවසර පිවිසීමේ අවදානම අවම කිරීම සඳහා ප්‍රමාණවත් මුරපද වින්‍යාසයන් බලාත්මක කිරීම තොරතුරු පද්ධතිවල ආරක්ෂාව පිළිබඳ වැදගත් කොටසකි. |
| (උ) සීමාසහිත ශ්‍රීලන්කන් කේටරින් ලිමිටඩ් පාලනය කරන, ශ්‍රීලන්කන් ගුවන් සමාගමෙහි දැනට පවතින “Corporate Information Security Privacy Management” අත්පොත ශ්‍රී ලන්කන් කේටරින් ලිමිටඩ්හි අතින් ප්‍රවේශ කළමණාකරණය සහ වෙනස් කළමණාකරණ ක්‍රියා පටිපාටි පිළිබඳ වත්මන් පරිචය පිළිබඳ වගන්ති වලින් සමන්විත නොවේ. කළමනාකරණය විසින් ව්‍යාපාරික අරමුණු/අවශ්‍යතාවලට අනුකූලව පැහැදිලි ප්‍රතිපත්තිමය දිශානතියක් සැකසිය යුතු අතර, පරිශීලක ප්‍රවේශ කළමනාකරණය සඳහා සහය සහ කැපවීම පෙන්නුම් කළ යුතු අතර, විස්තීර්ණ පරිශීලක ප්‍රවේශ කළමනාකරණයක් පවත්වා ගෙන යාම සහ | පරිශීලක ප්‍රවේශය සහ වෙනස් කළමණාකරණයේ වර්තමාන භාවිතය වන්නේ අතින් පෝරම හරහාය. මෙය 2024 දෙවන කාර්තුව වන විට වෙනස් කළමණාකරණ පද්ධතියකට මාරු වනු ඇත. ශ්‍රීලන්කන් ගුවන් සේවය නව පද්ධතියක් ඇගයීමට ලක් කරමින් පවතින අතර ශ්‍රී ලන්කන් කේටරින් එම ක්‍රමයටම අනුගත වීමට අදහස් කරයි. | පරිශීලක ප්‍රවේශ කළමනාකරණය සහ වෙනස් කළමණාකරණ ක්‍රියාවලීන් ප්‍රමාණවත් ලෙස සහ යෝග්‍ය ලෙස ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා ශ්‍රී ලන්කන් කේටරින් සමාගම පාලනය කරන පවතින ප්‍රතිපත්ති ලේඛනයේ කළමනාකරණය ප්‍රවේශ කළමනාකරණය පිළිබඳ වැදගත්කම සහ වගන්ති අර්ථ දැක්වීම සහ කළමනාකරණ අංශ වෙනස් කිරීම ඉතා වැදගත් වේ. |

කළමනාකරණය වෙනස් කිරීම කළමනාකරණය කිරීම තුළින්, ප්‍රමාණවත් නොවීම් පවතින බැවින්, පරිශීලක ප්‍රවේශ කළමනාකරණය සහ සමාගමේ පවතින ප්‍රතිපත්ති වෙනස් කළමණාකරණ ක්‍රියා පටිපාටි තොරතුරු තාක්ෂණ පරිසරය තුළ සිදු කෙරෙන නුසුදුසු ක්‍රියාවලට හේතු විය හැකි අතර, එය අනාවරණයකින් තොරව පැවතිය හැකි අතර වංචනික ක්‍රියාකාරකම්වලට ද හේතු විය හැක.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 6,514.14 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ පාඩුව රු.මිලියන 2,854.80 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 9,368.94 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආදායම රු.මිලියන 8,640.78 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ආ) සමාගමේ 2017/18 වර්ෂයේ සිට 2020/21 දක්වා එකතු කළ අගය ක්‍රමයෙන් අඩු වී ඇති අතර 2021/22 වර්ෂයේ සිට එය සුළු වශයෙන් වැඩි වී ඇත. විස්තර පහත දැක්වේ.

| විස්තරය | | | (රු.මිලියන) | | | |
|---|---|---|---|---|---|---|
| | **2022/23** | **2021/22** | **2020/21** | **2019/20** | **2018/19** | **2017/18** |
| බදු පසු ලාභය (ලාභාංශ ගෙවීමට පෙර) | 4.697.21 | 2,802.70 | (909.23) | 4,759.51 | 5,602.50 | 3,890.30 |
| එකතු : සේවක පඩිනඩි | 2,211.52 | 1,147.42 | 948.52 | 1,202.97 | 1,128.26 | 1,019.78 |
| රජයට ගෙවූ ලාභාංශ (සෘජු) | | | | | | |
| වරණීය කොටස් | | | 81.27 | 130.10 | 130.10 | 130.10 |
| සාමාන්‍ය කොටස් | - | 2,382.24 | 3,569.63 | 1,701.25 | 3,280.18 | 5,314.10 |
| රජයට ගෙවූ බදු | | | | | | |
| ජාතිය ගොඩනැඟීමේ බදු | - | | | 0.41 | 0.55 | 0.16 |
| එකතු කළ අගය මත බදු | - | | 2.59 | 7.64 | 13.55 | 11.42 |
| වෙනත් බදු - ESC | - | | | 33.95 | 48.79 | 41.99 |
| ක්ෂය හා ක්‍රමක්ෂය කිරීම | 468.34 | 467.32 | 454.38 | 377.72 | 218.33 | 196.55 |
| **එකතුව** | **7,377.07** | **6,799.73** | **4,147.16** | **8,213.55** | **10,422.26** | **10,604.40** |

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

වසර හයක් සඳහා මාර්තු 31 දිනට සමාගමේ තත්ත්වයට අදාළ වැදගත් අනුපාත පහත පරිදි වේ.

| | 2022/23 | 2021/22 | 2020/21 | 2019/20 | 2018/19 | 2017/18 |
|---|---|---|---|---|---|---|
| ජංගම වත්කම්වලට ජංගම වගකීම් (වාර ගණන) | 7.53 | 12.58 | 16.67 | 6.16 | 7.82 | 6.44 |
| ක්ෂණික අනුපාතය | 7.24 | 12.30 | 16.26 | 6.01 | 7.55 | 6.14 |
| ණය හිමි අනුපාතය | 0.06 | 0.10 | 0.19 | 0.14 | 0.21 | 0.26 |
| EPS- කොටසක ඉපැයීම් | 5.00 | 2.98 | (0.96) | 5.06 | 5.96 | 4.14 |
| කොටසකට ලාභාංශය | - | - | - | 3.80 | 4.47 | 3.10 |
| දළ ලාභ අනුපාතය | 75% | 74% | 53% | 81% | 79% | 77% |
| හිමිකමට ඉපැයුම් | 32% | 26% | (12%) | 39% | 59% | 58% |
| තොග පිරිවැටුම් අනුපාතය | 7.55 | 4.77 | 1.33 | 5.19 | 5.99 | 6.35 |

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ ජංගම වත්කම් හා ජංගම වගකීම් අනුපාතය සහ ක්ෂණික වත්කම් අනුපාතය ප්‍රධාන වශයෙන් වෙළඳ ගෙවිය යුතු අඩුවීම හේතුවෙන් අඩු වී ඇත.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා සමාගම ලාභ ඉපැයූ බැවින්, පසුගිය වසරට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ කොටසක ඉපැයීම 2.02 කින් ඉහළ ගොස් ඇත. එසේම, කොටසක ඉපැයීම පසුගිය වසරට සාපේක්ෂව සියයට 23 කින් වැඩි වී ඇත.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා රු.මිලියන 61.1 ක මුදලක් වැය කර තිබුණද, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.2.1 (ආ) සහ (ඇ) අනුව 2022/23 වර්ෂය සඳහා පිළිවෙලින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සහ සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ශ්‍රීලන්කන් කේටරින් සමාගම විසින් වසර දෙකක කාලයක් ආවරණය වන හා අවශ්‍ය අවස්ථාවලදී එය යාවත්කාලීන කළ හැකිවන පරිදි වාර්ෂිකව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කරනු ලැබේ. ඉදිරි වසර තුන සඳහා ශ්‍රී ලන්කන් කේටරින් සමාගම වෙතින් සපයනු ලබන පාරිභෝගික ගුවන් සේවා සංඛ්‍යාවේ දෘශ්‍යතාව දැකිය නොහැකි බැවින් වසර තුනක් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීම ප්‍රායෝගික නොවේ. කෙසේ වෙතත්, අවධාරණය කර ඇති පරිදි, ඉදිරි වසර තුනක ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට කටයුතු කරනු ඇත. | ඉදිරියේදී මෙවැනි ක්‍රියාවන් වළක්වා ගැනීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අතිරේක 35 මගින් සංශෝධිත රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 2.14 වගන්තියට අනුව සහ ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ මහලේකම්වරයාගේ අංක NPC/PP/01/97 සහ 2020 ඔක්තෝබර් 29 දිනැති ලිපියේ විධිවිධාන අනුව, භාණ්ඩ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියාගේ උපරිම අනුමත කිරීමේ සීමාව රු.500,000 ක් විය. කෙසේ වෙතත්, නියැදි විගණනයේ දී සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා ඉහත විධිවිධාන උල්ලංඝනය කරමින් රු.මිලියන 28 ක් වූ කොන්ත්‍රාත්තු 5 ක් යටතේ භාණ්ඩ ප්‍රසම්පාදනය කර ඇති බව අනාවරණය විය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල අධිකාරී සීමාවන් ප්‍රායෝගික නොවන බැවින්, NPC උපදෙස් මත, සමාගම 2019 සිට අනුමත ආයතනික විශේෂිත ප්‍රසම්පාදන අත්පොතක් ලබා ගැනීමට උත්සාහ කළේය. ශ්‍රීලන්කන් කේටරින් සමාගම 2020 නොවැම්බර් 21 දින මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන, අමාත්‍යාංශයෙන් වත්මන් ප්‍රසම්පාදන අධිකාරී සීමාවන් අනුමත කරන ලෙස ඉල්ලා සිටියද තවමත් එය තීරණාපේක්ෂිතය. එසේ වුවද, මෙහෙයුම්වලට ඇති විය හැකි බාධා වළක්වා ගැනීම සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබා ගන්නා තෙක් මණ්ඩලයේ අනුමත කළ ප්‍රසම්පාදන අධිකාරී සීමාවන් සමඟ ඉදිරියට යාමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දෙන ලදී. 2010 ජනවාරි 20 සහ 2020 නොවැම්බර් 21 දිනැති මණ්ඩල අනුමැතියන්ට අනුව ප්‍රධාන විධායක නිලධාරී වෙත ලබා දී ඇති අධ්‍යක්ෂ මණ්ඩලය කළ අනුමත ප්‍රසම්පාදන සීමාවන්ට අනුව විගණන ඡේදයේ දන්වා ඇති ප්‍රසම්පාදනයන් සිදු කරන ලදී. | ඉදිරියේදී මෙවැනි ක්‍රියාවන් වළක්වා ගැනීමට හා වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඇ) | අයවැය වෙන් කිරීමකින් සහ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 5.4.4, 7.12.1, 7.12.2 (අ) 8.7.1(ආ), 8.9 සහ 8.12.2 අනුගමනය කිරීමකින් තොරව, සමාගම විසින් රු.මිලියන 1.78 කට ආහාර සපයන Hi-Loaders සඳහා CCTV කැමරා මිලදී ගෙන තිබුණි. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය තුළ, මෙම කැමරා ක්‍රියාත්මක නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය. | සමාගම විසින් පාර්ශව 11 දෙනෙකුගෙන් ටෙන්ඩර් කැඳවා පුළුල් ප්‍රචාරයක් ලබාදී ඇතත් ලැබී ඇත්තේ එක් ලංසුවක් පමණි. සමාගමට මෙහෙයුම් අවශ්‍යතා ප්‍රමාදයකින් තොරව සම්පූර්ණ කිරීමට අවශ්‍ය වූ බැවින්, තනි ලංසුවක් සමඟ ඉදිරියට යාමට තීරණයක් ගන්නා ලදී. ප්‍රසම්පාදනයේ වටිනාකම රු.මිලියන 5 ට අඩු බැවින් TEC විසින් ලංසු මිලක් සාකච්ඡා කිරීමේ අවශ්‍යතාවයක් නොමැති විය. මෙම ටෙන්ඩරයේ ප්‍රසම්පාදන කමිටුව වන ප්‍රධාන විධායක නිලධාරියාගෙන් මෙම ප්‍රසම්පාදනය සඳහා අනුමැතිය ලබාගෙන ඇත. සැපයුම්කරුගේ ඉල්ලීම පරිදි සියයට 70 ක අත්තිකාරම් ගෙවා ඇති අතර සැපයුම්කරුගෙන් වැඩ අවසන් කිරීමේ සහතිකය ලැබීමෙන් පසු ඉතිරිය ගෙවා ඇත. විද්‍යුත් තැපෑලෙන් ප්‍රතිග්‍රහන ලිපියක් නිකුත් කර ඇති අතර වගකීම් කාලය අවසන් වූ පසු විධිමත් ගිවිසුමක් අත්සන් කරනු ලැබේ. ගහන යාත්‍රාංගන ප්‍රදේශයේ සංඥා නැතිවීම නිසා කැමරා සජීවීව නැරඹිය නොහැක. | ඉදිරියේදී මෙවැනි ක්‍රියාවන් වළක්වා ගැනීමට හා වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 7.12.1 සහ 7.12.2 (අ), 8.9 සහ 8.12.2 අනුගමනය නොකර සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 1.56 ක කාර්යාල ප්‍රදේශය සඳහා නව CCTV කැමරා ප්‍රසම්පාදනය කර තිබුණි. | සමාගම 2016 වසරේ සිට Flight kitchen හි CCTV කැමරා සඳහා සේවා සපයන්නාගෙන් මිල ගණන් ඉල්ලා ඇති අතර මෙම කොන්ත්‍රාත්තුව මෙම සේවා සපයන්නාට ලබා දී ඇත. වගකීම් කාලය අවසන් වීමෙන් පසුව විධිමත් ගිවිසුමක් අත්සන් කරනු ලැබේ. 2010 ජනවාරි 20 සහ 2020 නොවැම්බර් 21 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට අනුව ප්‍රධාන විධායක නිලධාරී වෙත ලබා දී ඇති අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමත ප්‍රසම්පාදන සීමාවන්ට අනුව සිදු කර ඇති ප්‍රසම්පාදනයේ කිසිදු උල්ලංඝනයක් නොමැත. | ඉදිරියේදී මෙවැනි ක්‍රියාවන් වළක්වා ගැනීමට හා වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඉ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රතිපාදන 2.5.1, 6.3.6, 6.3.2, 7.12.1, 7.12.2,(අ), 8.10.1 සහ 8.12.3 අනුගමනය කිරීමකින් තොරව හා රු.මිලියන 6.5 ක අයවැය ප්‍රතිපාදන ඉක්මවමින් සමාලෝචිත වර්ෂය තුළදී සමාගම විසින් රු.මිලියන 19.44 ක උඳුන් දෙකක් මිලදී ගෙන තිබුණි. | කිසිදු ණයක් ලබා නොගෙන අමතර මුදල සමාගම සතු අරමුදල්වලින් අරමුදල් සපයා ගන්නා ලදී. කෙසේ වෙතත්, මෙය ඉදිරියේදී අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවල ද සඳහන් වනු ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය, ප්‍රසම්පාදන කමිටුවක් නොවේ. මේ සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර ඇති බව කරුණාවෙන් සලකන්න. | ඉදිරියේදී මෙවැනි ක්‍රියාවන් වළක්වා ගැනීමට හා වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඊ) | UL ආපනශාලාව නවීකරණය කිරීම සඳහා අයවැයෙන් රු.මිලියන 58.5 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණු අතර නවීකරණය සමස්තයක් ලෙස සලකා ලංසු කැඳවා තිබුණි. කෙසේ වෙතත්, පසුව ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 20 දක්වා අඩු කර කිබුණු අතර සම්පූර්ණ ව්‍යාපෘතිය කුඩා කොටස්වලට බෙදා සැපයුම්කරුවන් 30 දෙනෙකුට කොන්ත්‍රාත්තුව ලබා දී තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.7, 2.8, 2.6.1, 4.3.1, 5.4.4, 6.3.2, 6.3.6, 7.2, 7.9.7 සහ 8.12.3 අනුගමනය නොකර මෙම කුඩා කොන්ත්‍රාත්තු ප්‍රසම්පාදනය කර තිබුණි. UL ආපනශාලාව වෙනම ලාභ උපයන ඒකකයක් ලෙස හඳුනාගෙන නොතිබුණ අතර ශ්‍රී ලන්කන් කේටරින් සමාගම විසින් සීමාසහිත ශ්‍රීලන්කන් ගුවන් සමාගම ගුවන්තොටුපල සහ ගුවන්සේවා (ලංකා ශ්‍රී) පුද්ගලික සමාගම සමඟ UL ආපනශාලාවේ එක් එක් සමාගමේ කාර්ය මණ්ඩලයට | සමාගම් දෙකේම කළමනාකාරිත්වයේ තීරණයට අනුව, ශ්‍රීලන්කන් කේටරින් සමාගම 2022/23 අයවැයෙන් රු.මිලියන 58.5 ක ඇස්තමේන්තුගත කර තිබුණි. අධක්ෂ මණ්ඩලයේ තීරණයට අනුව ඇස්තමේන්තු කරන ලද අළුත්වැඩියා කිරීමේ පිරිවැය රු.මිලියන 20 කි. නවීකරණ සැලැස්ම සඳහා කාලය ගත වූ අතර ඉදිකිරීම් අවසන් වන තුරු ප්‍රධාන ආපන ශාලාව තාවකාලික ස්ථානයක ඉදිකරන ලදී. රු.මිලියන 5 ට අඩු සෑම ප්‍රසම්පාදනයක් සඳහාම ලංසු විවෘත කිරීමේ කමිටුවක් පත් කිරීමේ අවශ්‍යතාවයක් නොමැත. ප්‍රමාණ බිල්පත, නඩත්තු කළමණාකරු විසින් සකස් කරන ලද අතර රු.මිලියන 5 ට අඩු ප්‍රසම්පාදන සඳහා TEC නොමැතිව ශ්‍රීලන්කන් කේටරින් සමාගමෙහි සම්මත ඇගයීම් බලධාරියා ඔහු වන අතර ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ප්‍රධාන විධායක නිලධාරියාට ලබා දිය හැක. AASL කාර්යමණ්ඩලයට සහන මිලට හිමිකමක් නොමැති බැවින් අපි AASL සමඟ ගිවිසුමකට එළඹ නැත. | ඉදිරියේදී මෙවැනි ක්‍රියාවන් වළක්වා ගැනීමට හා වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සුබසාධන ප්‍රතිලාභ බෙදා ගන්නේ කෙසේද යන්න පිළිබඳව ගිවිසුම්වලට එළැඹ නොතිබුණි. ව්‍යාපෘති සැලසුම් කිරීමේ ප්‍රමාදය හේතුවෙන් තාවකාලික ස්ථානය සඳහා සමාගමට රු.මිලියන 2.19 ක අමතර මුදලක් දැරීමට සිදු වූ අතර සත්‍ය මුළු පිරිවැය රු.මිලියන 23.29 ක් විය. | | |
| (උ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.2.2 සහ 4.2.3 ප්‍රකාරව ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග නියමිත වේලාවට අවසන් කිරීම සහ ඒ සඳහා හොඳම වෙළඳපල වටිනාකම ලබා ගැනීම සහතික කිරීම සඳහා සමස්ත ප්‍රසම්පාදන ක්‍රියාවලියම ඵලදායි ලෙස සැලසුම් කිරීම අත්‍යවශ්‍ය වේ. කෙසේ වෙතත්, බිත්තර ප්‍රසම්පාදනය සම්පූර්ණ කිරීමට සමාගමට අමතර දින 221 ක් ගතවී තිබුණි. මෙම කාලය තුළ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.6 අනුගමනය නොකර එකඟ වූ මිල ඉක්මවා ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් සහ ලියාපදිංචි නොකළ සැපයුම්කරුවන්ගෙන් බිත්තර මිලදී ගැනීම සඳහා රු.මිලියන 7.15 ක මුදලක් වැය කර තිබුණි. | දේශීය බිත්තර මිල ඉහළ ගොස් හිඟයක් ඇති වූ විට අපි මිලදී ගත්තේ රටේ අඩුම මිලට බිත්තර ලබාදෙන රාජ්‍ය ආයතනයක් වන රාජ්‍ය වාණිජ සමාගමෙන් පමණයි . බොහෝ දුරටලංසු ඇගයුම සඳහා කාලයක් ගතවන අතර එය අනාගතයේ දී කඩිනම් වනු ඇත. හදිසි අවශ්‍යතාවයක් නිසා, මිලදී ගැනීම සඳහා අනුමැතිය අදාළ ප්‍රසම්පාදන කමිටුවෙන් ලබාගෙන පසුව DPC විසින් සහතික කර ඇත. කෙසේ වෙතත් ඉදිරියේදී ගිවිසුම අලුත් කරනු ලැබේ. | ඉදිරියේදී මෙම ක්‍රියාවන් වළක්වා ගැනීමට හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රමාද කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

**3.13 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකින් තොරව අනුමත කාර්යය මණ්ඩලයේ නොමැති තනතුරු විසිපහක් සඳහා නිලධාරීන් විසිපහක් බඳවාගෙන තිබූ අතර 2023 මාර්තු 31 දිනට අතිරික්ත නිලධාරින් පනස් හතකි. | මෙම තනතුරු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සම්පූර්ණ අනුමත සේවක සංඛ්‍යාව තුළ වේ. තනතුරු, වෙනස් වුවද, ලබා දී ඇති ශ්‍රේණි වර්ගය සඳහා වඩාත් සුදුසු වේ. | අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | සමාගමේ මානව සම්පත් ප්‍රතිපත්ති අත්පොතෙහි කාර්ය මණ්ඩල පත්කිරීම් සඳහා බලයලත් නිලධාරියා හඳුනාගෙන නොතිබුණි. | අදාළ තනතුර/ ශ්රේණිය සලකා බලමින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සඳහා ස්වාධීන සාමාජිකයින් තෝරාගනු ලබයි. | අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ඇ) | සමාගමේ මානව සම්පත් ප්‍රතිපත්ති අත්පොතෙහි 3.2.4 සහ 3.2.3 වගන්තිවලට පටහැනිව, ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් හි ගුවන්තොටුපළ සේවා සහ භාණ්ඩ කොන්ත්‍රාත් විධායක නිලධාරියා සමාගමේ ප්‍රසම්පාදන විධායක ලෙස 2022 මැයි 09 දින සිට පත් කර තිබුණි. | එකම/ සමාන ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා අයදුම් කිරීමට සීමාවක් නොමැත. තෝරාගත් අයදුම්කරු අභ්‍යන්තර අපේක්ෂකයෙකි. (ශ්‍රී ලන්කන් ගුවන් සේවයේ සේවක) සහ එම අපේක්ෂකයා අයදුම්කරුවන් අතර හොඳම අපේක්ෂකයා විය. | ඉදිරියේදී මෙම ක්‍රියාවන් වළක්වා ගැනීමට හා වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඇ) | කළමනාකරණ ගණකාධිකාරී තනතුර සඳහා අයදුම්පත් කැඳවා තිබුණි. කෙසේ වෙතත්, සම්මුඛ පරීක්ෂණයෙන් වැඩිම ලකුණු ලබාගත් අපේක්ෂකයා තෝරාගෙන අනුමත සේවක සංඛ්‍යාවේ නොමැති සහකාර කළමනාකරණ ගණකාධිකාරීවරයෙකු ලෙස පත් කර තිබුණි. | මෙම තනතුර 8.1 විධායක තනතුරකි. එබැවින් කළමනාකරණ හැකියාව සලකා බලනු නොලැබේ.<br>තෝරාගත් අපේක්ෂකයා අවසාන සම්මුඛ පරීක්ෂණයේදී වඩාත්ම සාර්ථක අපේක්ෂකයා වූ අතර ඉහළම ලකුණු ලබා ගත්තේය. | ඉදිරියේදී මෙම ක්‍රියාවන් වළක්වා ගැනීමට හා වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |